ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1948/4 - 2016 ජනවාරි මස 04 වැනි සඳුදා - 2016.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 8/3/5/25 .

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/15/2011/*වීඊ/45*.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාශයේ උඩවරදමන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක මු.පි.මා/1629 දරණ පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දක්වා ඇති පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් සඳහා මායිම්.

1. **කැබලි අංක 1 - හපුගහලන්දවත්ත - ප්‍රමාණය හෙක්ටයාර් 0.3591 - මුල් හිමිකම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.**

*උතුරට*: එස්. සොත්තිලිංගම් හිමිකම් කියන හපුගහලන්දවත්ත; *නැගෙනහිරට*: ටී. ජී. කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන හපුගහලන්දවත්ත; *දකුණට*: මාර්ගය; *බටහිරට*: මාර්ගය (ප්‍රාදේශීය සභාව).

2. **කැබලි අංක 2 - හපුගහලන්දවත්ත - ප්‍රමාණය හෙක්ටයාර් 0.8561 - මුල් හිමිකම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.**

*උතුරට*: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ මාර්ගය; *නැගෙනහිරට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හපුගහලන්ද වත්ත සහ මාර්ගය; *දකුණට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හපුගහලන්දවත්ත; *බටහිරට*: මාර්ගය (ප්‍රාදේශීය සභාව).

ඉහත සඳහන් ඉඩම් සඳහා හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 26 වැනි දින පෙ. ව. 9.00 ට මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2015 දෙසැම්බර් මස 29 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

01 - 650

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22797 - 28 - (2016/01)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

උක්ත ශීර්ෂ යටතේ අංක 1896/6 හා 2015.01.05 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් මිනුම් පිඹුරුපත් අංක ඉවත් කොට ඒ වෙනුවට වෙනත් මිනුම් පිඹුරුපත් අංක ආදේශ කිරීමෙන් පහත සඳහන් සංශෝධනය කරන බව මෙයින් ප්‍රසිද්ධියේ දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු කොටස* | *ඉවත් කළ කොටස වෙනුවට ආදේශ කළ යුතු කොටස* |
|---|---|
| VA/VA/2014/140 | Topo PP No. 57 |

කේ. උදයරාජා,
ප්‍රාදේශීය ලේකම්
වවුනියාව.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-652/1

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

උක්ත ශීර්ෂ යටතේ අංක 1904/4 හා 2015.03.02 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් මිනුම් පිඹුරුපත් අංක ඉවත් කොට ඒ වෙනුවට වෙනත් මිනුම් පිඹුරුපත් අංක ආදේශ කිරීමෙන් පහත සඳහන් සංශෝධනය කරන බව මෙයින් ප්‍රසිද්ධියේ දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු කොටස* | *ඉවත් කළ කොටස වෙනුවට ආදේශ කළ යුතු කොටස* |
|---|---|
| VA/VA/2014/141 | Topo PP No. 57 |

කේ. උදයරාජා,
ප්‍රාදේශීය ලේකම්
වවුනියාව.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-652/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.